## මධ්‍යම පරිසර අධිකාරිය - 2013

මධ්‍යම පරිසර අධිකාරියේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 6 (3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

මගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යාන්තර විගණන ප්‍රමිතවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිත වලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාරිවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටීන් සැලසුම් කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශන වල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණන විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරි බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගනණය කළ විගණන මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට මධ්‍යම පරිසර අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත**

පරිසර ඇගයීම් වාර්තාවේ කොන්දේසි කඩ කිරීම නිසා ව්‍යාපෘතියක් අත්හිටුවීම සහ නීත්‍යානුකූලව ඉඩම් පවරා ගැනීමකින් තොරව තොරතුරු (සොබාකෙත) මධ්‍යස්ථානයක් ඉදිකිරීම යන කරුණු මුල් කරගෙන බාහිර ආයතනයක් හා පුද්ගලයෙකු විසින් පිළිවෙලින් රු.මිලියන 460 ක් හා අදාල නඩුව පැවරූ දින සිට දිනකට රු.10,000 බැගින් වන්දි ඉල්ලා අධිකාරියට එරෙහිව නඩු පවරා තිබුණද, එකී නඩු වලින් පැන නැගිය හැකි අසම්භාව්‍ය වගකීම් වල ස්වභාවය පිළිබඳ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 08 අනුව මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි.

**2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) එක්සත් ජාතීන්ගේ පාරිසරික අරමුදල මඟින් ජාතික රසායනික ද්‍රව්‍ය පැතිකඩ යාවත්කාලීන කිරීමේ ව්‍යාපෘතිය සඳහා ලබාදී තිබුණු ප්‍රදානයන්ගෙන් ඉතිරිව තිබුණු රු. 1,664,495 ක් ප්‍රදාන යටතේ ගිණුම් ගතකරනු වෙනුවට ගෙවිය යුතු වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ආ) නව වෙබ් අඩවියක් සංවර්ධනය සඳහා වැය කර තිබුණු මුදල රු.115,000 ක් වුවද, එය රු. 230,000 ක් ලෙස ගිණුම්ගත කිරීම නිසා වර්ෂයේ වියදම හා ගෙවිය යුතු වියදම් රු.115,000 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.

(ඇ) නිශ්චිතව ගනුදෙනු හඳුනාගැනීමකින් තොරව රසායනාගාර උපකරණ, පරිගණක මෘදුකාංග, ලී බඩු හා කාර්යාල උපකරණ යන වත්කම් වලට අදාළව එකතුව රු. 3,512,216 ක මුදලක් මාර්ගස්ථ තොග හා කෙරීගෙන යන වැඩ ලෙස ජංගම නොවන වත්කම් යටතේ සහ එයට අදාල වගකීම ගෙවිය යුතු වියදම් ලෙස ජංගම බැරකම් යටතේ සාවද්‍ය ලෙස දක්වා තිබුණි.

(ඈ) අධ්‍යාපන වැඩසටහන් සහ පර්යේෂණ හා අධ්‍යාපන වියදම් සඳහා දැරිය යුතු වියදම් ලෙස රු.3,939,000 ක මුදලක් කෙරීගෙන යන වැඩ හා උපචිත වියදම් යටතේ දක්වා තිබුණි. එසේ වුවත් එම වැඩසටහන් සඳහා සත්‍ය වශයෙන් ගෙවීම් කිරීමට අධිකාරිය බැඳී නොමැති බැවින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අධිකාරියේ වත්කම් හා වගකීම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.

**2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**

පහත සඳහන් නීති රීති, රෙගුලාසි වලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසි වලට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 12.2.6 වගන්තිය | අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතියකින් තොරව නිලධාරීන් 07 දෙනෙකු වැඩ බැලීමේ තනතුරු වලට පත්කර තිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 757 (ඇ) | වටිනාකම රු.125,571,509 ක් වූ රසායනාගාර උපකරණ වෙනුවෙන් භාණ්ඩ සමීක්ෂණ වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඇ) | 1994 ජුනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | චක්‍රලේඛ නියමයන්ට පටහැනිව අධිකාරියේ නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් 22 ක් සඳහා ප්‍රවාහන දීමනාව ලෙස රු. 1,455,000 ක් සහ නිල නිවාස සඳහා රු. 107,000 ක් ගෙවා තිබුණි. |
| (ඈ) | 2006 ඔක්තෝබර් 10 දිනැති අංක 1466/5 දරන ගැසට් පත්‍රය. | ඝනකමින් මයික්‍රොන 20 හෝ ඊට අඩු පොලිතීන් නිෂ්පාදනයක් දේශීය භාවිතය සඳහා නිෂ්පාදනය කිරීම, පොලිතීන් නිෂ්පාදනයක් විකිණීමට හෝ භාවිතා කිරීම තහනම්කර තිබුණද මෙකී නියෝගයක් ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය පරීක්ෂා කිරීමට අධිකාරිය විසින් කටයුතු කර නොතිබුණි. |
| (ඉ) | 2009 මැයි 26 දිනැති අංක 39 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය | අතිරේක දීමනා ගෙවීමේදී ඒ සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ එකඟතාවය ලබාගත යුතු වුවද එයට පටහැනිව පශ්චාත් උපාධි සුදුසුකම් ලබා ඇති නිලධාරීන්ට වැටුප් වර්ධක තුන බැගින් ලබාදී තිබුණි. සමාලෝචිත වර්ෂය තුළදී පමණක් නිලධාරීන් 22 කට මෙසේ ගෙවා තිබූ මුදල රු.20,445ක් විය. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වලට අනුව සමාලෝචිත වර්ෂයේ අධිකාරියේ මෙහෙයුම් කටයුතු වල ප්‍රතිඵලය රු. මිලියන 28.6 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. මිලියන 30.6 ක් විය. ඒ අනුව ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී ඌනතාවයේ රු.මිලියන 2 කින් අඩුවීමක් පෙන්නුම් කෙරුණි. සමාලෝචිත වර්ෂයේ භාණ්ඩාගාර ප්‍රදාන සහ අනෙකුත් මෙහෙයුම් ආදායම් රු.මිලියන 77.4 කින් වැඩිවී තිබුණද, මෙහෙයුම් වියදම් රු.මිලියන 77.9 කින් වැඩිවී තිබීම හා විලම්බිත අයභාර ආදායම් රු.මිලියන 4.5 කින් අඩුවී තිබීම මෙයට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

### 3.2 ආයතනය විසින් ආරම්භකර ඇති නෛතික සිද්ධි

ආයතනය විසින් පරිසර දූෂණය හා පරිසර බලපත්‍ර ලබා නොගැනීම සම්බන්ධයෙන් බාහිර ආයතන හා පුද්ගලයින්ට එරෙහිව සමාලෝචිත වර්ෂය අවසානයේ අධිකරණ වල නඩු 110 ක් ගොනුකර තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්යසාධනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ) පරිසර පැමිණිලි**

(i) පැමිණිලි සම්බන්ධව අධිකාරිය විසින් අනුගමනය කරනු ලබන ක්‍රියා පටිපාටියට අනුව පරිසර පැමිණිලි සම්බන්ධව දින 14 ක් ඇතුළත අවශ්‍ය ක්‍රියාමාර්ග ගතයුතු වුවත් ප්‍රධාන කාර්යාලයේ පැමිණිලි අංශය විසින්, මාතර දිස්ත්‍රික් කාර්යාලය වෙත 2013 මාර්තු මස යොමු කර තිබුණු පරිසර පැමිණිලි 03 ක් සම්බන්ධව, 2013 මැයි අවසානය දක්වා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ii) පරිසර පැමිණිලි පිළිබඳව දත්ත ගබඩාවක් (Data Base) නඩත්තු කර නොතිබුණු අතර පැමිණිලි සම්බන්ධයෙන් ගනු ලැබූ ක්‍රියාමාර්ග වල ප්‍රගතිය සමාලෝචනය කර නොතිබුණි.

**(ආ) පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත්කිරීම**

(i) පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීමේ කොන්දේසි අංක 22 පරිදි බලපත්‍රය වලංගු කාලය තුළදී මාස 03 කට වරක් අපජලය විශ්ලේෂණ වාර්තා ඉදිරිපත් කරන ලෙස දක්වා ඇතත් එම කාර්යය ඉටුකිරීම සම්බන්ධව අධිකාරිය විසින් කටයුතු කර නොතිබුණි.

(ii) 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 23 " අ" වගන්තිය හා 2008 ජනවාරි 25 දිනැති 1533/16 දරන ගැසට් නිවේදනය අනුව කර්මාන්ත සඳහා පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ලබාගත යුතු වුවත් ආයෝජන මණ්ඩලයට අයත් කර්මාන්ත ශාලා 201 ක්ද ආයෝජන මණ්ඩලයට අයත් නොවන කර්මාන්ත ශාලා 5298 ක් ද බලපත්‍ර ලබාගෙන නොතිබුණි.

(iii) 2008 පෙබරවාරි 01 දිනැති අංක 1534/08 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය අනුව පරිසර ආරක්ෂක බලපත්‍රය ලබා ගැනීමට පෙර අපද්‍රව්‍ය මෝචනය හෝ බැහැර කිරීම සඳහා පාරිසරික ආරක්ෂණ බලපත්‍රයක් ලබාගත යුතු වුවත්, ආයෝජන මණ්ඩල කර්මාන්ත වලට පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාදීමේදී ඉහත බලපත්‍රය ලබාගන තිබේද යන්න පරීක්ෂාවට ලක්කර නොතිබුණි. නියැදි පරීක්ෂාවට අනුව අපද්‍රව්‍ය මෝචනය හෝ බැහැර කිරීම සඳහා බලපත්‍ර ලබානොගත් කර්මාන්ත 15 ක් සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත්කර තිබුණු බව නිරීක්ෂණය වූ අතර මෙම තත්ත්වය පරිසර ප්‍රශ්න උග්‍ර කිරීමට සෘජුව දායක වී තිබූ බව තවදුරටත් නිරීක්ෂණය විය.

(iv) බලපත්‍ර නිකුත් කරන ලද කර්මාන්ත සඳහා ලැබෙන පරිසර පැමිණිලි වෙනම හඳුගැනීම සහ විසඳීම සඳහා ක්‍රමවේදයක් හඳුන්වා දී නොතිබූ අතර කර්මාන්ත සඳහා ලැබෙන පැමිණිලි සම්බන්ධයෙන් පරීක්ෂා කිරීමකින් තොරව පරිසර එකඟතා ලබාදී තිබුණු බව විගණනයේදී කළ පරීක්ෂාවේදී තවදුරටත් නිරීක්ෂණය විය.

**4.2 කළමනාකරණ තොරතුරු පද්ධතියක් පවත්වාගෙන යෑම**

අධිකාරිය විසින් පවත්වාගෙන යනු ලබන පරිගණක තොරතුරු පද්ධතිය සඳහා ආපදා ප්‍රතිදාන සැලැස්මක් (Disaster Recovery Management System) අධිකාරිය විසින් හඳුන්වා දී නොතිබුණි.

**4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

ප්‍රාදේශීය සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාල වලට අනුයුක්ත පරිසර නිලධාරීන් ජ්‍යෙෂ්ඨ පරිසර නිලධාරීන්, ප්‍රාදේශීය පරිසර නිලධාරීන් හා පරිසර නිලධාරීන් ලෙස මට්ටම් 03 ක් යටතේ රාජකාරි කළද මෙම මට්ටම් වෙනම හඳුනාගෙන රාජකාරි පැවරීමක් සිදුකර නොතිබුණ අතර අධීක්ෂණය කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වාදී නොතිබුණි. සමාලෝචිත වර්ෂය තුල නිලධාරීන් විසින් කලවැඩ පිළිබඳ තහවුරුකර ගැනීම සඳහා ඉදිරි වැඩසටහන් හා ප්‍රගති වාර්තා නොමැතිව පරිසර නිලධාරීන්ගේ ගමන් වියදම් හා සංයුක්ත දීමනා රු.7,200,431 ක් ගෙවා තිබුණි.

**4.4 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

මයික්‍රෝන 20 ට අඩු පොලිතීන් නිෂ්පාදන පරීක්ෂාව සඳහා 2007 වර්ෂයේදී රු. 452,660 ක් වියදම් කර මිලදී ගෙන තිබූ පරීක්ෂණ උපකරණ 10 ක්, 2014 අගෝස්තු අවසානය දක්වාම ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

**4.5 හඳුනාගන්නා ලද පාඩු**

කළමනාකරණ මණ්ඩල අනුමැතිය මත රු.104,083 ක් වූ මිශ්‍ර අත්තිකාරම් ගිණුම් වලින් ලියා හැර තිබූ නමුත් ඒ සම්බන්ධයෙන් භාණ්ඩාගාර අනුමැතිය ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

**4.6 දෘශ්‍ය අක්‍රමිකතා**

දොම්පේ සනීපාරක්ෂක කසල බිම් පිරවුම ව්‍යාපෘතියෙහි ඉදිකිරීම් කටයුතු වලට අදාළව සිදුවී තිබුණු රු.49,623,542 ක අලාභය අයකර ගැනීම සම්බන්ධයෙන් 2014 අගෝස්තු අවසානය දක්වාම අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**4.7 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) දකුණු පළාත් කාර්යාලය ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව සඳහා රු.මිලියන 48ක් ප්‍රතිපාදනය කර තිබුණු අතර ඒ සම්බන්ධව පහත අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) 2008 වර්ෂයේදී මෙම ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා රු.380,721 ක් වැයකර සැලසුම් සකස් කර තිබුණද එම සැලසුම ඉවත් කර උපදේශක සභාව විසින් සකස් කළ නව සැලසුමකට අනුව කටයුතු ආරම්භ කර තිබූ අතර, උපදේශක සමාගම විසින් ගොඩනැගිල්ල නියමිත ප්‍රමිතීන්ට අනුව සැලසුම් සකස්කර නොතිබීම හේතුවෙන් අත්‍යාවශ්‍ය නොවන වැඩ කොටස් වෙනුවෙන් රු.4,619,082 ක අතිරේක පිරිවැයක් දැරීමට සිදුවී තිබුණි.

(ii) ඉදිකිරීම් කටයුතු නියමිත දිනට නිම නොකිරීම හේතුවෙන් අයකළ යුතුව තිබුණු රු.4,735,738 ක් ප්‍රමාද ගාස්තු අයකර ගෙන නොතිබුණි.

(iii) ගොඩනැගිල්ලේ කොටසක නවාතැන් පහසුකම් සඳහා ස්ථානයක් ඉදිකිරීමට II අදියර සඳහා මුළු කොන්ත්‍රාත් පිරිවැය වූ රු. 23,926,797 ක මුදලින් සියයට 25 ක් හෙවත් රු. 6,036,897 ක් ම ඇස්තමේන්තු කර තිබුද වර්ග අඩි 120 බැගින් වූ කාමර දෙකක් සහ තරප්පු පෙළක් සහිත නවාතැන් පහසුකම් සඳහා ඉදිකළ කොටස වෙනුවෙන් රු.5,480,517 ක් වියදම්කර තිබුණි. මෙවැනි අතිරේක පිරිවැයක් දැරීමට භාණ්ඩාගාරයේ අනුමැතියක් ලබාගෙන නොතිබුණි.

(iv) ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු සඳහා අතිරේක වැය ඇස්තමේන්තුවක් මත රු. 816,032 ක මුදලක් වියදම්කර තිබුණු අතර, මෙම කාර්යයන් ඉටුකර ගැනීමේදී කොන්ත්‍රාත්කරුට රු.861,000 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.

(v) කොන්ත්‍රාත් සමාගම විසින් ඉංජිනේරුවරයෙකුට මාසිකව රු.75,000 බැගින් මාස 13 ක් සඳහා රු.975,000 ක් ගෙවා තිබූ අතර එම කාර්යය ඉටුකිරීම සඳහා අධිකාරිය විසින් ද තවත් ඉංජිනේරුවරයෙකුට මසකට රු.50,000 බැගින් මාස 11 ක් සඳහා රු.550,000 ක මුදලක් ගෙවා තිබුණි.

(ආ) දොම්පේ සනීපාරක්ෂක කසල රඳවන බිම් පිරවුම් ව්‍යාපෘති පරිශ්‍රයේ ප්‍රවේශ මාර්ගය ඉදිකිරීමට රු.මිලියන 69.5 ක කොන්ත්‍රාත්තුවක් ප්‍රදානය කර තිබූ අතර සිදුකළ ස්ථානීය විගණන පරීක්ෂාවේදී රු. මිලියන 22.26 ක අධි ඇස්තමේන්තුවක් කර ඇතිබවත් කොන්ත්‍රාත්කරුට රු.මිලියන 8.15 ක් වැඩිපුර ගෙවා තිබූ බවත් නිරීක්ෂණය විය.

මාර්ගය ඉදිකිරීම් කටයුතු නියමිත ප්‍රමිතියට සිදුකර නොමැති බව රසායනාගාර වාර්තා 05 ක් මගින් පෙන්නුම්කර ඇතත් අධිකාරිය මේ සම්බන්ධව අවධානය යොමුකර නොතිබුණි.

(ඇ) කසල රඳවන ව්‍යාපෘතිය 2013 වර්ෂයේ අවසානයට අවසන්කර ප්‍රයෝජනයට ගැනීමට සැලසුම් කර තිබූ නමුත් ඉදිකිරීම් කටයුතු නිමකර තිබුණේ 2014 මැයි මාසයේදීය. කෙසේවුවද 2014 සැප්තැම්බර් වනවිටත් එය ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කර නොතිබුණි.

**4.8** ප්‍රමාද වූ ව්‍යාපෘති

-------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ජාතික රසායනික ද්‍රව්‍ය පැතිකඩ යාවත්කාලීන කිරීමේ ව්‍යාපෘතිය සමාලෝචිත වර්ෂයේ ජනවාරි මාසයේදී නිමකිරීමට නියමිතව තිබූ නමුත් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ සැලසුම පිළියෙල කිරීම 2014 මාර්තු 10 දින වන විටත් නිමකර කර නොතිබුණු අතර, ව්‍යාපෘති වර්තාව සැකසීම සඳහා ගිවිසුම අත්සන් කළ අවස්ථාවේදී රු.336,000 ක අත්තිකාරම් මුදලක් ගෙවා තිබුණි. අවශ්‍යතා හඳුනාගැනීමටත් පෙර රු.558,840 ක් වැයකර ව්‍යාපෘතිය සඳහා කාර්යාල උපකරණ මිලදී ගෙන තිබීමෙන් එම උපකරණ වර්ෂයකට වැඩි කාලයක් නිශ්කාර්යව පැවතුණි.

(ආ) **ආර්ථික සහයෝගිතා අරමුදලේ ණය පහසුකම් මත සන අප ද්‍රව්‍ය බැහැරකිරීමේ පහසුකම් ඉදිකිරීමේ ව්‍යාපෘතිය (EDCF)**

ව්‍යාපෘති කාර්යමණ්ඩලය 2012 වර්ෂයේදී බඳවාගෙන ව්‍යාපෘති ගිවිසුම 2013 ජුලි 23 අත්සන් කර තිබුණු නමුත් වසර 02 ක කාලයක් ගතවී තිබුණද යෝජිත බිම් පිරවුම් 04 කි. ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොතිබුණි. කෙසේවුවද සමාලෝචිත වර්ෂයේ අවසන් දින දක්වා වූ ව්‍යාපෘතියේ සමුච්චිත වියදමින් සියයට 64 ක් වූ රු.11,028,095 ක පිරිවැය ව්‍යාපෘති කාර්යමණ්ඩලය වෙනුවෙන් දරා තිබුණද ව්‍යාපෘතිය යටතේ යෝජිත බිම් පිරවුම් 04 හි ඉදිකිරීම් කටයුතු වසර 02 ක කාලයක් තිස්සේ ආරම්භ කර නොතිබුණි.

(ඇ) 2008-2010 අවුරුදු 03 ක කාල පරිච්ඡේදය තුළ නිම කිරීම සඳහා ආරම්භ කරන ලද “පිළිසරු ව්‍යාපෘතිය” වෙනුවෙන් භාණ්ඩාගාරය විසින් රු. බිලියන 5.633 ක් වෙන්කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) ව්‍යාපෘතිය 2010 වර්ෂයේ නිමකිරීමට සැලසුම් කර තිබුණද 2014 අගෝස්තු අවසානය දක්වාම නිමකර නොතිබුණු අතර ව්‍යාපෘතිය සඳහා වෙන්කර තිබූ රු.බිලියන 5.633 ක මුදලින් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා වැයකර තිබුණේ රු.බිලියන 1.965 ක් හෙවත් සියයට 35ක් පමණි.

(ii) ව්‍යාපෘතිය යටතේ කුඩා පරිමාණ කොම්පෝස්ට් අංගන 103 ක් ඉදිකිරීමට සැලසුම් කර තිබුණු අතර එයින් 69 ක් පමණක් ඉදිකර තිබුණි. එම ඉදිකිරීම් වලින් අංගන 31 ක් ඉදිකිරීම සඳහා පළාත් පාලන ආයතන 31 කට රු. මිලියන 66.73 ක මුදලක් ලබාදී තිබුණද, ඉන් 13 ක ඉදිකිරීම් ආරම්භකර නොතිබුණු අතර අංගන 03 ක් අතහැර දමා තිබුණි. ඉදිකිරීම් කරන ලද අංගන 14 ක කොම්පෝස්ට් නිෂ්පාදනය ආරම්භ කර නොතිබූ අතර අනෙක් අංගනය උපරිම ධාරිතාවෙන් පොහොර නිෂ්පාදනය කිරීමට අපොහොසත්වී වී තිබුණි.

(iii) ඉදිකිරීමට සැලසුම් කළ මහා පරිමාණ කොම්පෝස්ට් අංගන 14 ක් අතරින් 06 ක් ඉදිකර තිබුණද, රු.මිලියන 248.7 ක් වැයකර ඉදිකර තිබූ මහා පරිමාණ කොම්පෝස්ට් අංගන 03 ක් පසු විපරම් කටයුතු නොකිරීම සහ මෙහෙයුම් අකාර්යක්ෂමතාවයන් නිසා අසාර්ථක වී තිබුණි.

(iv) නොදිරන කසල කළමනාකරණය කිරීම සඳහා බිම් පිරවුම් ස්ථාන 10 ක් පිහිටුවීමට සැලසුම් කර තිබුණද එයින් එක් ස්ථානයක් හෝ පිහිටුවා නොතිබුණ, අතර වෙන්කර තිබුණු මුදලින් රු.මිලියන 163 ක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා තාවකාලික බිම් පිරවුම් වෙනුවෙන් වැයකර තිබුණි.

(v) ව්‍යාපෘතියේ ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු සහ නියෝජ්‍ය කළමනාකරු (මහජන සම්බන්ධතා) යන තනතුරු සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති නිලධාරීන් බඳවාගෙන වැටුප් හා දීමනා ලෙස 2008 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා රු. 6,403,600 ක් ගෙවා තිබුණු අතර එම නිලධාරීන්ගේ සේවය සමාලෝචිත වර්ෂයේදී අවසන් කර තිබුණද ඔවුන්ගේ පාරිතෝෂික දීමනා ලෙස රු.524,825 ක් ද ගෙවා තිබුණි. ව්‍යාපෘතියේ අසාර්ථකත්වයට සුදුසුකම්ලත් කාර්යක්ෂම නිලධාරීන් නොසිටීම එක් හේතුවක් වී තිබූ බව නිරීක්ෂණය විය.

(vi) ව්‍යාපෘතියේ ගිවිසුමට අනුව කොම්පෝස්ට් අංගන ක්‍රියාකාරකම් ආරම්භ කිරීමට මසකට පෙර පරිසර ආරක්ෂණ බලපත්‍රයක් ලබාගත යුතු වුවත් කිසිදු කොම්පොස්ට් අංගනයක් සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාගෙන නොතිබුණි. තවද ව්‍යාපෘතියේ තිරසාර පැවැත්ම සඳහා නිෂ්පාදනය කරන පොහොරවල ගුණාත්මක භාවය ඉහළ නැංවීම සඳහා නයිට්‍රජන් බහුල ශාක සහිත වගාවන් ව්‍යාපෘතිය ආරම්භ කළ දින සිට ව්‍යාපෘති භූමිය තුළ අඛන්ඩව පවත්වාගෙන යාම සහ නඩත්තු කිරීමද එම ශාක පත්‍ර කොම්පෝස්ට් නිපදවීමේ අමුද්‍රව්‍යක් ලෙස යොදා ගැනීම සිදුකළ යුතු වුවද එසේ කටයුතු කර නොතිබුණි. තවද දැනට ක්‍රියාත්මක කරනු ලබන කොම්පෝස්ට් අංගන 91 කට අදාල තත්ත්ව පරීක්ෂණ වාර්තා අදාළ ගිවිසුම් ප්‍රකාරව මාස 03 කට වරක් ලබාගෙන නොතිබුණි.

(vii) ව්‍යාපෘතියේ අරමුදල් වලින් මිලට ගෙන තිබුණු වාහනයකට සිදුවී තිබුණු රු.6,050,000 ක අලාභය වසර 02 ක් ගතවී තිබුණද වගකිවයුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**4.9 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබාදුන් මණ්ඩලයේ සම්පත්**

අධිකාරිය විසින් අමාත්‍යවරයාගේ නිලධාරීන් වෙනුවෙන් ගුවන් ටිකට්පත් මිලට ගැනීම සඳහා රු.783,000 ක් වැයකර තිබුණු අතර නියෝජ්‍ය අමාත්‍යවරයාගේ කාර්යාලයේ සේවය කළ තාවකාලික

කම්කරුවන් දෙදෙනෙකු සහ රියදුරෙකු වෙනුවෙන් රු.692,255 ක වැටුප්, අතිකාල හා සංයුක්ත දීමනා අධිකාරියෙන් ගෙවා තිබුණි.

**4.10 කාර්ය මණ්ඩල පරිපාලනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2013 දෙසැම්බර් 31 දිනට අධිකාරියේ අනුමත කාර්යමණ්ඩලය 947 ක් වූ අතර තථ්‍ය කාර්ය මණ්ඩලය 715 ක් වුයෙන් පුරප්පාඩු 232 ක් විය.

(ආ) අධිකාරියේ බඳවාගැනීමේ පරිපාටිය මහ භාණ්ඩාගාරයේ සේවක කළමනාකරණ හා සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමත කරවාගෙන නොතිබුණි.

(ඇ) සේවකයන්ගේ පෞද්ගලික ලිපිගොනු වල අඩංගු අධ්‍යාපන සහතිකපත්වල ඡායාපිටපත් සත්‍ය හා නිවැරදි පිටපත් බවට සනාථකර ගෙන නොතිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**5.1 අභ්‍යන්තර විගණනය**

අභ්‍යන්තර පාලන පද්ධතීන් ශක්තිමත් කිරීම සඳහා අභ්‍යන්තර විගණන අංශය විසින් පරීක්ෂාවන් සිදුකර තිබුණද හඳුනාගත් දූර්වලතා නිවැරදි කිරීමට පියවර ගෙන නොතිබුණි.

**5.2 ප්‍රසම්පාදන සැලැස්ම**

2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ මඟපෙන්වීම් වලට අනුකූලව ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**5.3 නොවිසඳී ඇති විගණන ඡේද**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වායුතත්ත්ව පාලනය කිරීම, ශබ්ද හා කම්පන පාලනය, වාහන දුම් පරීක්ෂාව පාලනය කිරීම හා මාලේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම යන ශ්‍රී ලංකාවේ සංසරන වායුතත්ත්ව පසු විපරම් කිරීමේ ව්‍යාපෘතිය යටතේ කොළඹ කොටුවේ වායුතත්ත්ව පසු විපරම් කිරීමේ ඒකකයක් පිහිටුවීම යනාදිය සම්බන්ධයෙන් 2012 වර්ෂයේ සිට පෙන්වා දුන් අඩුපාඩු නිවැරදි කිරීමට පියවර ගෙන නොතිබුණි.

(ආ) ලුනාව ව්‍යාපෘතිය මඟින් හඳුනාගත් ආකාරයට සංවර්ධිත ඇල මාර්ග හා කාණු පද්ධතිය වෙත කර්මාන්ත හා නිවාස ව්‍යාපෘතිය මඟින් මළ අපවාහන පද්ධති සහ වෙනත් රසායනික අපද්‍රව්‍ය මුදා හැරීම තුළින් ඇල මාර්ග දූෂණය වීම සම්බන්ධ ජාතික පාරිසරික පනතේ 23 වගන්තිය අනුව කටයුතු කර නොතිබුණි.

(ඇ) 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත සංශෝධනය කර වැඩිදියුණු කිරීමට අවශ්‍ය හඳුනාගත් අංශයන් 18 වෙනුවෙන් පනතේ සංශෝධනයන් සිදුකර නොතිබුණි.

## 5.4 පාරිසරික හා සමාජ වගකීම ඉටුකිරීම

1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත හා 1988 අංක 56 දරන ජාතික පාරිසරික සංශෝධිත පනතේ 22 ඡේදය අනුව අවදානම් සහිත ජලය බැසයන ප්‍රදේශ හඳුනා ගැනීම සහ ආරක්ෂා කිරීම, ඵලදායි ලෙස පස සංරක්ෂණය කිරීම, පස සංරක්ෂණය සඳහා වැඩසටහන් නිර්දේශ කිරීම කළ යුතු වුවද ඊට පටහැනිව පාරිසරික ආරක්ෂාව නොසලකා පස් කැපීම සඳහා අධිකාරියේ නිර්දේශ ලබාදීමට කටයුතු කර තිබුණි. නිර්දේශ ලබාදීමේදී පාරිසරික ඇගයීමක් සිදුකර නොතිබීම හේතුවෙන් පාරිසරික පැමිණිලි ද ලැබී තිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර අධිකාරියේ සභාපතිවරයා වෙත දන්වන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) අයවැය
(ආ) පරිගණක මෘදුකාංග පද්ධතිය භාවිතය
(ඇ) ගිණුම්කරණය
(ඈ) ප්‍රසම්පාදන ක්‍රියාවලිය
(ඉ) පාරිතෝෂික වෙන්කිරීම්
(ඊ) පරිසර ආරක්ෂණ බලපත්‍ර
(උ) සේවක මණ්ඩල කටයුතු
(ඌ) කොන්ත්‍රාත් පාලනය
(එ) අභ්‍යන්තර විගණනය